UNITED NATIONS
HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER

2026-2027
මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකා වගවීමේ ව්‍යාපෘතිය පිළිබඳ යාවත්කාල කිරීම

අප්‍රේල් 2026

වරම

"වින්දිතයන් සහ දිවි ගළවාගත්තවුන් වෙනුවෙන් පෙනී සිටීම සඳහාත්, සාමාජික රටවල් සතු නිසි බලලත් අධිකරණ බලාධිකාරයන්ට ඇතුළු අදාළ **අධිකරණමය සහ වෙනත් නීති කෘත්‍යයන්ට සහාය වීම** සඳහාත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හෝ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස කඩකිරීම් සම්බන්ධයෙන් වන අනාගත **වගවීමේ ක්‍රියාවලිය** සඳහා යොදාගත හැකි උපාය මාර්ග **සංවර්ධනය කිරීම** පිණිස **තොරතුරු සහ සාක්ෂි එක් රැස් කිරීම, සම්පිණ්ඩනය කිරීම, විශ්ලේෂණය සහ සංරක්ෂණය කිරීම.**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ (OHCHR) **ශ්‍රී ලංකා වගවීමේ ව්‍යාපෘතිය (OSLap)** හරහා සිදුකරගෙන යනු ලැබූ ක්‍රියාකාරකම් ඇතුළුව, 46/1, 51/1 සහ 57/1 යන යෝජනා තුළින් OHCHR සහ එය වෙතින් ඉල්ලා තිබූ සියළු කාර්යයන්ගේ වරම **දෙවසරක කාල පරිච්ඡේදයක්** සඳහා දිගු කිරීම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් 2025 ඔක්තෝබරයේදී යළිත් අලුත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රගමනයේ වැදගත්කම කවුන්සිලය විසින් යළිත් අවධාරණය කරන ලද අතර එහි **63වැනි සැසියට (2026)** ලිඛිත යාවත්කාලීන කිරීමක් සහ **66වැනි සැසියට (2027)** විස්තීර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස OHCHR වෙතින් ඉල්ලා සිටිනු ලැබුණි.

මෙම වරම යටතේ, මානව හිමිකම් කවුන්සිලය විසින් පහත ඉල්ලීම් OHCHR වෙතින් ඉල්ලා සිටින ලදී.

- ශ්‍රී ලංකාවේ මානව හිමිකම් අපහරණයන් හා උල්ලංඝනයකිරීම් සහ ඒ හා බැඳුණු අපරාධ සම්බන්ධ වූ **තොරතුරු සහ සාක්ෂි එක් රැස් කිරීම, සම්පිණ්ඩනය කිරීම, විශ්ලේෂණය සහ සංරක්ෂණය කිරීම** සඳහා එය සතු ධාරිතාව ශක්තිමත් කිරීමට තවදුරටත් කටයුතු කිරීම.
- සාහසික මානව හිමිකම් උල්ලංඝනයන් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස කඩකිරීම් සම්බන්ධයෙන් **අනාගත වගවීම සඳහා යොදාගත හැකි ප්‍රවේශ මාවත් සංවර්ධනය කිරීම.**
- **වින්දිතයන් සහ බේරීගත් වින්දිතයන් සඳහා පෙනිසිටීම**; සහ
- නිසි බලලත් අධිකරණ බලාධිකාරයන් සහිත සාමාජික රාජ්‍යයන්ටද ඇතුළුව අදාළ අධිකරණමය සහ වෙනත් නීති කෘත්‍යයන්ට සහාය වීම.

වරම

මෙම ලේඛනය මගින් අදහස් කරන්නේ, 2026-2027 කාල පරිච්ඡේදය තුළ OHCHR විසින් ස්වකීය වරම ක්‍රියාවට නැංවීම පිළිබඳව එහි හවුල්කරුවන් සහ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීමයි.

2025 ප්‍රකාශයට පත්කළ, මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකා වගවීමේ ව්‍යාපෘතිය පිළිබඳ යාවත්කාල කිරීම මත ගොඩනංවන එය මහ කොමසාරිස්වරයාගේ මාර්ගෝපදේශනය යටතේ, වින්දිතයන් සහ ඔවුන්ගේ නියෝජිතයන් ඇතුළු හවුල්කරුවන් සහ සිවිල් සමාජයේ ප්‍රවිචාරණයන්ට අනුගාමීව නිර්මාණය කරන ලද අතර එකී වරම ක්‍රියාවට නැංවීමේ පළමු අවධිවල උගත් පාඩම් ප්‍රතිබිම්බනය කරනු ලබයි.

ස්වකීය වරම ක්‍රියාවට නැංවීමේදී, **ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වයස සහ අන්තර්ඡාංගික ප්‍රතිෂ්ඨාවන්** ඒකාබද්ධ කළා වූ, **බෙරීගත් වින්දිතයන් කේන්ද්‍රකොට ගත්, චිත්තවේගී කම්පනයන් පිළිබඳ දැනුවත්** ප්‍රවේශයක් තම වැඩ කටයුතු පුරා තවදුරටත් යොදාගැනීමට OSLap ක්‍රියාකරනු ඇත.

බෙරීගත් වින්දිතයන්, සාක්ෂිකරුවන් සහ පාර්ශ්වකරුවන් සමග ගණුදෙනු කිරීමේදී **ආරක්ෂාව, ගෞරවය සහ දැනුවත් කැමැත්ත** අඛණ්ඩවම ප්‍රමුඛ කොට සළකනු ඇත.

අපහරණ රටා, ව්‍යුහාත්මක අසමානතා සහ යුක්තියට ඇති බාධක හඳුනාගැනීමට, සියළුම විශ්ලේෂණ, වාර්තාකරණයන් සහ ප්‍රවිචාරණයන් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ වයස පිළිබඳ සංවේදී කාචයක් යොදාගනු ලබන අතර වගවීම පිළිබඳ ප්‍රයත්නයන්, **සියලු දෙනා ඇතුළත් කරගත්තා වූ, අපක්ෂපාතී** සහ ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනයන් ඇතුළු නන්විධ අත්දැකීම් වෙන්කොට දැක්වීම සඳහා **සහානුභූතික** ඒවා වීම සහතික කෙරෙනු ඇත.

මෙකී පසුබිම යටතේ, සහ අලුත් කරන ලද වරමෙහි පරාමිතීන්ගේ සීමා තුළ, වගවීම සහ සංක්‍රාන්ති යුක්ති ක්‍රියාදාමයට සහාය දැක්වීම සඳහා වන OSLap ක්‍රියා මාර්ගික මැදිහත්වීම්, OHCHRහි 2024-27 කළමනාකරණ සැලැස්ම සහ සංක්‍රාන්ති යුක්තිය උපායික මෙවලමක් වශයෙන් දක්වන මහ ලේකම්වරයාගේ මාර්ගෝපදේශන සටහනෙන් දැනුවත් වනු ඇති අතර යට දැක්වෙන ප්‍රවේශය හා ප්‍රමුඛතාවන්ට අනුකූලව සිදුකරගෙන යනු ඇත.

ආධාරක ස්ථම්භ 1

තොරතුරු සහ සාක්ෂි එක් රැස් කිරීම, සම්පිණ්ඩනය කිරීම, විශ්ලේෂණය සහ සංරක්ෂණය කිරීම

ප්‍රධාන සාක්ෂාත් කරගැනීම් (2025)

දේශීය සහ ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ තිරසාරව සිදුකරගෙන යනු ලබන කටයුතු හරහා ස්වකීය තොරතුරු සහ සාක්ෂි සංචිතය තවදුරටත් පුළුල් කිරීමට OSLap ක්‍රියාකරනු ලැබුණි. සිවිල් සමාජ සංවිධාන සමග විනිවිදභාවයෙන් යුතු, සුරක්ෂිත සහ තිරසාර සහයෝගීතාවයෙන් ක්‍රියාකිරීම පහසුකරනු පිණිස, සිවිල් සමාජ සංවිධානයන් සතු තොරතුරු සහ සාක්ෂි බෙදාගන්නේ කෙසේද යන්න සංක්ෂේපව දක්වමින්, අදාළ නීති, රෙගුලාසි සහ ආරක්ෂණයන්ද ඇතුළත් කොට ඉංග්‍රීසි, දෙමළ සහ සිංහල භාෂාවන්ගෙන් **ලියැවිල්ලක්** ප්‍රකාශයට පත්කිරීමට OSLap කටයුතු කළේය.



එමෙන්ම, තමන් සතු තොරතුරුවල ස්වභාවය, විෂය පථය සහ ප්‍රමාණය පිළිබඳ පරිදර්ශනයක් සම්පාදනය කරමින්, ස්වකීය සුරක්ෂිතාගාරය පිළිබඳ සංක්ෂිප්තයක්ද OSLap විසින් ප්‍රකාශයට පත්කරන ලදී.

2025දී සැළැසුම් කරන ලද ස්වකීය ප්‍රමුඛතා ප්‍රකාරව, තම තොරතුරු සහ සාක්ෂි හැඳුනුම් සංකේතනය, ව්‍යුහගතකිරීම සහ සිදුවීම් සළකුණුකරණය සම්බන්ධයෙන් වැදගත් ප්‍රගතියක් අත්කරගත් OSLap, එමගින් විශ්ලේෂණ වටිනාකමත්, සංසක්තතාවත්, ස්වකීය සුරක්ෂිතාගාරයේ උපයෝගීතාවත් වැඩි දියුණු කරගත්තේය.

මීට සමාන්තරව, චූදිත අපරාධකරුවන්ට අදාළ **විශ්ලේෂණාත්මක ලඝු සටහන්ද** ශක්තිමත් කිරීමට සහ අභ්‍යන්තර නිවාරණ ක්‍රියාදාමයට සහාය දීම සඳහා ස්වකීය සුරක්ෂිතාගාරයේ ඇතුළත්ව ඇති තොරතුරු සහ සාක්ෂි විවෘත මූලාශ්‍ර මගින් අනුපූරණය කරමින්, ඒ පිළිබඳ ඉලක්කගත **විවරණයන්** සහ **විශ්ලේෂණයන්** OSLap විසින් සිදුකරන ලදී.

ආධාරක ස්ථම්භ 1

තොරතුරු සහ සාක්ෂි එක් රැස් කිරීම, සම්පිණ්ඩනය කිරීම, විශ්ලේෂණය සහ සංරක්ෂණය කිරීම

2027 සැප්තැම්බර් දක්වා ප්‍රමුඛතා

තනි පුද්ගල වගකීමටත්, විධාන දාමයටත්, උචිත තැන්වලදී අපරාධ මූලික රටාවන්ටත් අදාළ සාක්ෂි ශක්තිමත් කිරීම සඳහා **ඉලක්කගත විමර්ශන සහ විශ්ලේෂණ වැඩකටයුතු** OSLap විසින් අඛණ්ඩව ප්‍රමුඛත්වයෙහි ලා ක්‍රියාකරනු ඇති අතර, චෝදනා එල්ල වූ අපරාධකරුවන් පිළිබඳව තිබෙන තොරතුරු නිරීක්ෂණය කිරීම පිණිස ඊට උචිත ආරක්ෂණ පිළිවෙත්වලට අනුකූලව අදාළ පාර්ශ්වකරුවන් සමග සහයෝගීතාව සවිබල ගැන්වීමට කටයුතු කරනු ඇත.

යෝග්‍ය ප්‍රවේශ ලක්ෂ්‍යයන් හමුවන තන්හිදී, **චෝදනා ලද චර්යාවන් පිළිබඳ** ජාත්‍යන්තර නීතිය යටතේ **නීතිමය අර්ථසිද්ධාවන් සැපයීම** ඇතුළුව **සම්පිණ්ඩිතවූ ද, අභිචෝදනා ගොණුකිරීම දෙසට දිශානත වූද** විශ්ලේෂණාත්මක ගොණු සූදානම් කිරීමට OSLap විසින් මුල් තැන් දෙනු ලැබේ.

මීට සමාන්තරව, ස්වකීය සුරක්ෂිතාගාරය පිළිබඳ **පොදු සංක්ෂිප්ත තොරතුරු යාවත්කාලීන කිරීම මගින් එහි විනිවිදභාවය, දිගුකාලීන සංරක්ෂණය සහ ප්‍රවේශක රාමුව** ශක්තිමත් කිරීමට OSLap අඛණ්ඩව කටයුතු කරනු ඇත. ඒ සම්බන්ධයෙන් උනන්දුව දක්වන ශාස්ත්‍රාලීය හවුල්කරුවන් සහ අවශේෂ පාර්ශ්වකරුවන් සමග සහයෝගයෙන්, තම සුරක්ෂිතාගාරය සතු ප්‍රසිද්ධ තොරතුරු ඇතුළත් **විවෘත මූලාශ්‍ර පුස්තකාලයක්** ස්ථාපිත කිරීමට ඇති හැකියාව පිළිබඳවද OSLap ගවේෂණය කරනු ඇත.

අනුමතියත්, ආරක්ෂාව සහ රහස්‍යභාවයත් පිළිබඳ අවශ්‍යතා ගැන පූර්ණව සැලකිලිමත් වෙමින්, විත්දිතයන් සහ ඔවුන්ගේ නියෝජිතයන් ඇතුළු අදාළ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධීකරණයෙන් යුතුව, සත්‍යය සොයන අතුරුදහන්වූවන්ගේ පවුල්වලට සහාය වීම සඳහා, **ස්වකීය සුරක්ෂිතාගාරය සතු බලහත්කාරී අතුරුදහන්කිරීම්වලට අදාළ රටාවන් පිළිබඳ නිර්නාමික සහ විසුරුවා ලූ දත්ත** ප්‍රකාශයට පත්කිරීමට ඇති හැකියාව OSLap විසින් ගවේෂණය කරනු ඇත.

ආධාරක ස්ථම්භ 2

නිසි බලලත් අධිකරණ බලාධිකාරයන් සහිත සාමාජික රාජ්‍යයන් තුළදීත්, ඇතුළුව අදාළ අධිකරණමය සහ අවශ්‍ය නීති කෘත්‍යයන් සඳහා සහායවීම

ප්‍රධාන සාක්ෂාත් කරගැනීම් (2025)

කාර්යසාධක දේශීය වගවීමක් නොමැති තත්ත්වයක් තුළ, සර්වභෞමික අධිකරණ බලය යටතේ සිදුවීම් පිළිබඳව සොයාබලන අධිකරණ බලාධිකාරයන් විසින් සහාය ඉල්ලා සිදුකරන **විධිමත් ඉල්ලීම්වලට (RFAs) සහයෝගය දැක්වීම** OSLap විසින් ප්‍රමුඛ කොටගනු ලැබුවේ, සිය අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන් අනුකූලනය කරමින්ද, දැනුවත් අනුමැතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය කරන සාක්ෂිකරුවන් යළිත් සම්බන්ධකරගනිමින් සහ එක්සත් ජාතීන්ගේ රාමුවලට සහ නිසි ජාත්‍යන්තර ක්‍රියාපටිපාටිමය ප්‍රමිතීන්ට අනුකූලව අදාළ සන්දර්භීය තොරතුරු සහ සාක්ෂි සැපයීමද මගිනි.

විනිසුරුවරුන්ද, අභිචෝදකයන් හා විමර්ශන අධිකාරයන්ද සමග කටයුතු කිරීම ශක්තිමත් කළ OSLap, ගවේෂක ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වමින් උචිත තැන්හිදී සාක්ෂි සැපයීමට කැමැත්ත පළකරන සාක්ෂිකරුවන් සහ බලධාරීන් අතර **සෘජු සබඳතා ඇතිකිරීම සඳහා පහසුකාරකත්වය** සැපයීය.



ආධාරක ස්ථම්භ 2

නිසි බලලත් අධිකරණ බලාධිකාරයන් සහිත සාමාජික රාජ්‍යයන් තුළදීත්, ඇතුළුව අදාළ අධිකරණමය සහ අවශේෂ නීති කෘත්‍යයන් සඳහා සහායවීම

2027 සැප්තැම්බර් දක්වා ප්‍රමුඛතා

නිසි බලලත් අධිකාරයන් වෙතින් ලැබෙන ඉල්ලීම් මත, විමර්ශන සහ අභිචෝදනා ගොණුකිරීම්වලට **සහාය වනු** පිණිස **කාලෝචිත වූද, අදාළ වූද තොරතුරු, විශ්ලේෂණ සහ සාක්ෂි** සම්පාදනය කිරීමට OSLap අඛණ්ඩව ක්‍රියාකරනු ඇත.

ලබාගත හැකි ආධාර සහ තොරතුරු පිළිබඳ දැනුවත්භාවය නංවාලනු පිණිසද **අධිකරණ බලාධිකාරයන් සමග ප්‍රගාමී ලෙස** කටයුතු කරනු ලැබේ.

අනුමතිය, ආරක්ෂාව සහ රහස්‍යභාවය පිළිබඳ අවශ්‍යතාවන්ට යටත්ව, **බලධාරීන් සහ මූලාශ්‍ර අතර සම්බන්ධතා ඇතිකිරීමට පහසුකාරකත්වය සැපයීමට** OSLap තැන්වැසිව අඛණ්ඩ ලෙස ක්‍රියා කරනු ඇත.

ආධාරක ස්ථම්භ 3

වින්දිතයන් සහ ගැළවී ගත්තවුන්ගේ කර්තෘකත්වය හා ඔවුන්ට සහයෝගය දැක්වීම වෙනුවෙන් පෙනී සිටීම

ප්‍රධාන සාක්ෂාත් කරගැනීම් (2025)

වගවීම සොයන පිරිස් ආන්තීකරණයට සහ හිරිහැරයන්ට මුහුණදීම අඛණ්ඩව සිදුවන සන්දර්භයක් තුළ, **වින්දිතයන්, බේරීගත්තවුන් සහ සිවිල් සමාජය** හා තිරසාරව කටයුතු කිරීම හරහා තම **අන්තර්ආංශික, වින්දිත කේන්ද්‍රීය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි අවධානය යොමුකළ ප්‍රවේශය** තවදුරටත් සවිබල ගැන්වීමට OSLap පසුගිය වසර තුළ ක්‍රියා කළේය.

OSLap, **230කට වැඩි සිවිල් සමාජ සංවිධානද**, නීති ක්‍රියාධරයන් සහ වින්දිතයන්ගේ සංගම්ද සමග කටයුතු කළ අතර ජාත්‍යන්තර සිවිල් සමාජ සංවිධාන සහ ඩයස්පෝරාවද, ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක සංවිධානද, ළමා අයිතිවාසිකම් පිළිබඳ විශේෂඥයන් සහ ස්ත්‍රී මානව හිමිකම් ආරක්ෂකයන්ද ඇතුළු **මානව හිමිකම් ආරක්ෂකයන් 40කට වැඩි පිරිසක්ද** සමග ප්‍රවිචාරණයේ යෙදුණි.

ආරක්ෂාව, අනුමතිය සහ උපදේශන ප්‍රොටෝකෝලයන් සහතික කළ මෙකී ප්‍රවිචාරණයන් OSLapහි විශ්ලේෂණ, වාර්තාකරණය සහ උද්දේශන ක්‍රියාමාර්ග දැනුවත් කරනු ලැබුණේය.

පිරිමින්, ස්ත්‍රීන් සහ ළමුන්ට එරෙහි ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනයන්ගේ කල්පවත්නා හානියත්, දණ්ඩ මුක්තිය හා හිරිහැර චිරස්ථායීව පැවතීමත්, ගැටුම්වලින් පසු ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් පිළිබඳ වාර්තාවන් ඇතුළු ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම් උල්ලංඝනය කිරීමත්, ඉස්මතුකොට දැක් වූ OSLap හි **“අපට සියල්ල සමග යුක්තිය පිළිබඳ අපේක්ෂාවත් නැතිවිය” ලියැවිල්ලද** මෙකී ප්‍රවිචාරණයන්ගෙන් දැනුවත් කෙරිණ.

ආධාරක ස්ථම්භ 3

වින්දිතයන් සහ ගැළවී ගත්තවුන්ගේ කර්තෘකත්වය හා ඔවුන්ට සහයෝගය දැක්වීම වෙනුවෙන් පෙනී සිටීම

2027 සැප්තැම්බර් දක්වා ප්‍රමුඛතා

තම අන්තර්ආංශික, වින්දිත කේන්ද්‍රීය, ස්ත්‍රී පුරුෂ සමාජභාවී සහ ළමුන් කෙරෙහි සංවේදී ප්‍රවේශය මත පදනම්ව, සිය උපායික දිශානතියත්, තේමාත්මක ප්‍රතිදානයත්, උද්දේශන ප්‍රමුඛතා සහ දිගු කාලීන සංරක්ෂණ හා ප්‍රවේශ රාමුවත් දැනුවත් කරනු සඳහා හානියට පත් ප්‍රජාවන් අතර වින්දිතයන්, බේරීගත්තවුන්, පවුල් සාමාජිකයන් හා සිවිල් සමාජ ක්‍රියාධරයන් සමග සැළසුම් සහගත ප්‍රවිචාරණ කටයුතු OSLap විසින් අඛණ්ඩව සිදුකරනු ඇත.

මානුෂීය සහන සේවාවන්ට බලපාන උල්ලංඝනයන්, මාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රහාර සහ ළමුන්ට එරෙහි අයිතීන් කඩකිරීම් සම්බන්ධයෙන්ද ඇතුළත්ව ඉලක්කගත උද්දේශන සහ දැනුවත්භාවය නංවාලන මුලපිරීම් මාලාවක් මෙකී ප්‍රවිචාරණයන් මගින් ආවේදනය කරනු ඇත.


ලැබී ඇති වරමට ඕබ්බට යමින්, උද්දේශන ක්‍රියාමාර්ග දිගටම පවත්වාගෙන යාම සහ තොරතුරු සම්බන්ධයෙන් ඇති ප්‍රවේශය සහතික කරන්නා වූ **පශ්චාත් OSLap වගවීම පිළිබඳ මාර්ග සිතියමක් සම-නිර්මාණය කිරීමට** සිවිල් සමාජ සංවිධාන සහ වින්දිත සංගම් කැඳවීමටත්, මානසික සෞඛ්‍යය සහ මනෝ-සමාජීය අවශ්‍යතා සමාලෝචනයට හා බේරීගත්තවුන් විසින් මෙහෙයවන ස්මරණය කිරීම් හා පිළිගැනීම්වලට සහාය දැක්වීමත් ඇතුළු වින්දිතයන්ගේ පාර්යාවලෝකය මත පදනම් වූ **හානිපූරණය සහ ප්‍රතිකර්ම පිළිබඳ පර්යේෂණ** සිදුකිරීමටත් OSLap ක්‍රියාකරනු ලැබේ.

ආධාරක ස්ථම්භ 4

අනාගත වගවීමේ කාර්යාවලින් සඳහා භාවිතා කළ හැකි උපායයන් සංවර්ධනය කිරීම

ප්‍රධාන සාක්ෂාත් කරගැනීම් (2025)

මානව හිමිකම් කවුන්සිලයේ 60වන සැසියට ඉදිරිපත් කරනු ලැබූ මහා කොමසාරිස්වරයාගේ වාර්තාවෙන් විස්තර කළ පරිදි, අන්තර් රාජ්‍ය ක්‍රියාදාමයන් නොමැතිකම සහ අන්තර්ජාතික අපරාධ අධිකරණයේ අණසක ශ්‍රී ලංකාව විසින් පිළිනොගැනීම හමුවේ ශ්‍රී ලංකාව තුළ සිදුකළ අපරාධ සම්බන්ධයෙන් දේශීය සහ ජාත්‍යන්තර වගවීමේ ප්‍රගතිය සීමාසහිත එකක් වී තිබේ. බරපතල උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු බවට චෝදනා එල්ලව ඇති තනි පුද්ගලයන්ට එරෙහිව ඉලක්කගත සම්බාධක ඇතැම් රාජ්‍යයන් විසින් පනවනු ලැබ ඇති අතර සාපරාධී වගවීමට හිලව් වශයෙන් මෙකී ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවේ.



මෙම සන්දර්භය තුළ, ජාතික මට්ටමේදී **වගවීම කෙරෙහි සංයුක්ත කැපවීමක් පෙන්නුම් කිරීමට ශ්‍රී ලංකා රජය දිරිගන්වන අතරම** සාමාජික රාජ්‍යයන්, අභිචෝදකයන්, වගවීම පිළිබඳ ක්‍රියාකරන්නන්, සිවිල් සමාජ සංවිධාන සහ චින්දිත කණ්ඩායම් සමග ස්වකීය කටයුතු OSLap විසින් ශක්තිමත් කර තිබේ. **විශේෂඥ පිරිස් හා සිදුකරන ප්‍රවිචාරණයන් සහ ද්විපාර්ශ්වික හුවමාරු** හරහා දැනට තිබෙන දේශීය හා ජාත්‍යන්තර නීතිමය මාර්ග භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීමත්, උපායමාර්ගික සම්බන්ධීකරණය කිරීමත් OSLap විසින් සිදුකළ අතර, ශ්‍රී ලංකාවේ චිරස්ථායීව පවත්නා වගවීම පිළිබඳ හිඳැස කෙරෙහි ජාත්‍යන්තර අවධානය තිරසර කරනු පිණිස එය දායක විය. වගවීම පෙරට ගෙනයාම හා බෙරීගත් චින්දිතයන්ට ප්‍රතිකර්ම සැපයීම අරමුණු කරගෙන ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනයන් ගැන **OSLap විසින් සිදුකළ වැඩකටයුතු** පිළිබඳ සන්දර්භය තුළ ප්‍රකාශයට පත්කළ ප්‍රවිචාරණයන් සහ නිර්දේශයන් ඇතුළු තේමාත්මක උද්දේශන විසින් මෙකී ප්‍රයත්නයන්ට වැඩිදුරටත් ආධාර සපයන ලදී.

ආධාරක ස්ථම්භ 4

අනාගත වගවීමේ කාර්යාවලීන් සඳහා භාවිතා කළ හැකි උපායයන් සංවර්ධනය කිරීම

2027 සැප්තැම්බර් දක්වා ප්‍රමුඛතා

ප්‍රවිචාරණ කටයුතුවලදී මතුකළ උත්සුකතා මත පදනම්ව, බලහත්කාරී අතුරුදහන්කිරීම් සහ ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනයන් ඇතුළු කලින් ප්‍රකාශයට පත්කළ වාර්තා, සාමාජික රාජ්‍යයන්, රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාධරයන් හා සිවිල් සමාජය සමග සිදුකරන සැලැස්මානුකූල පසු විපරම් කටයුතුවලදී උද්දේශන මෙවලම් වශයෙන් ක්‍රියාකාරීව යොදාගැනීම සහතික කිරීමට OSLap ක්‍රියාකරනු ඇත.

ඉලක්කගත ප්‍රචාරණය සහ තිරසාර මැදිහත්වීම් හරහා එකී වාර්තාවල නිර්දේශ ක්‍රියාවට නැංවීම ප්‍රවර්ධනය කිරීමටත්, බෙරීගත් විත්දිතයන්ගේ හඬ නංවාලීමටත්, ජාත්‍යන්තර අවධානය පවත්වාගෙන යාම සහ වගවීම සහ ප්‍රතිකර්ම යෙදීම දෙසට සංයුක්ත පියවර දිරිගැන්වීමටත් OSLap කටයුතු කරනු ලැබේ.

දේශීය නීතිය යටතේ සර්ව භෞමික අධිකරණ බලය අභ්‍යාස කිරීම හරහා මතුවන අවස්ථාවන් ඇතුළු, යුක්තිය සඳහා වන සංයුක්ත මාවත් පෙරට ගැනීම සඳහා **වගවීම පිළිබඳ ක්‍රියාකාරීන් සමග හවුල්කාරීත්වයන් ශක්තිමත් කිරීමට සහ සෘජුව කටයුතු කිරීමට** තවදුරටත් OSLap ක්‍රියාකරනු ඇත.

නෛතික සහ ක්‍රියාපටිපාටිමය සීමාවන් පිළිබඳ සිදුකරන ඇගයීමක්ද සමග, විභවයක් සහිත අධිකරණ බලාධිකාරයන්ද, අදාළ අභිචෝදක ඒකකයන් සහ ක්‍රියාමාර්ග සඳහා ප්‍රයෝගික ප්‍රවේශ ස්ථානද සළකුණු කිරීම ඇතුළු දැනට තිබෙන වගවීම හා සම්බන්ධ යාන්ත්‍රණයන් පිළිබඳ සංක්ෂිප්ත, පොදුවේ පරිශීලනය කළ හැකි ලුහුඬු ලේඛන OSLap විසින් සම්පාදනය කරනු ඇත.

වගවීම පිළිබඳ මූලපිරීම්වලට සහාය වනු පිණිස විශ්ලේෂණ නිපැයුම් සහ අපරාධකරුවන් පිළිබඳ ලඝු සටහන්ද සංවර්ධනය කිරීමට OSLap ක්‍රියාකරනු ඇත.

ජාතික සහ ජාත්‍යන්තර වගවීම පිළිබඳ වන ප්‍රවේශයන් දැනුවත් කරනු පිණිස ඊට උචිත තැන්නිදී, රාජ්‍ය වගකීමට අදාළ විභවතා මානයන්ද ඇතුළුව අයිතීන් උල්ලංඝනය කිරීම් හා සම්බන්ධ ව්‍යුහාත්මක සහ සංස්ථානික රටාවන් OSLap විශ්ලේෂණ කටයුතු මගින් පරීක්ෂා කරනු ඇත්තේය.

වගවීම සම්බන්ධයෙන් ගෙන ඇති, පොදුවේ ප්‍රසිද්ධව ඇති කරුණු සහ ක්‍රියාපටිපාටිමය පියවරයන් විදහා පෙන්වීම සඳහා කිසියම් තෝරාගත් ලාංඡනික සිදුවීම් OSLap විසින් ලේඛනගත කරනු ඇත්තේය.

ආධාරක ස්ථම්භ 5

ශ්‍රී ලංකාවේ වින්දිතයන්ට සහ සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලියට සහාය වීම

ප්‍රධාන සාක්ෂාත් කරගැනීම් (2025)

දේශීය මට්ටමේදී **වගවීම සහ සංක්‍රාන්ති යුක්තිය ප්‍රවර්ධනය කරන අතරේම** OSLap විසින් **ශ්‍රී ලංකාවේ වින්දිතයන්ට සහාය සපයා තිබේ.**

රැකවරණය සහ අනුමැතිය හා සම්බන්ධ ආරක්ෂණයන් කෙරෙහි පූර්ණ වශයෙන් සැළකිලිමත් වෙමින්, වින්දිතයන්, බෙරීගත්තවුන්, ඔවුන්ගේ නියෝජිතයන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් සමග තිරසරව කටයුතු කිරීම හරහා ඔවුන්ගේ පර්යාවලෝකයන් සිය විශ්ලේෂණ සහ වාර්තාකරණයන් දැනුවත් කිරීමට යොදාගැනීම සහතික කිරීමට OSLap ක්‍රියාකර තිබේ.

වින්දිතයන් හා පෘථුල ලෙස සම්බන්ධ වෙමින්, චෙම්මනි සමූහ මිනීවළ ආශ්‍රිත ප්‍රදේශයත්, අනුස්මරණ පරිශ්‍රයත් නිරීක්ෂණය කරමින් 2025 ජූනි මස කරන ලද මහ කොමසාරිස්වරයාගේ චාරිකාවට අදාළ සන්දර්භය තුළ සිදුකළ කටයුතුද ඇතුළුව, ශ්‍රී ලංකාවේ OHCHR විසින් කරන්නා වූ පුළුල් උද්දේශන ප්‍රයත්නයන්ටද OSLap දායක වී තිබේ.



මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් ෆොල්කර් ටූර්ක් චෙම්මනි සමූහ මිනීවළ පරිශ්‍රයට සිදුකළ චාරිකාවල 2025 ජූනි 25. © ඇන්තනී හෙඩ්ලි / OHCHR

ආධාරක ස්ථම්භ 5

ශ්‍රී ලංකාවේ වින්දිතයන්ට සහ සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලියට සහාය වීම

2027 සැප්තැම්බර් දක්වා ප්‍රමුඛතා

වගවීම හා සම්බන්ධ ප්‍රයත්නයන්හිදී **OSLap සමග අර්ථකාරීව ලෙස කටයුතු කරන මෙන්** වූ ඉල්ලීම OHCHR විසින් යළිත් අලුත් කරනු ලබයි.

ජාත්‍යන්තර, දේශීය සහ ප්‍රාදේශීය තලවලදී OHCHR කටයුතු දැනුවත් කිරීම සඳහාත්, **ලාංඡනික සිදුවීම් සම්බන්ධයෙන් හා අයිතීන් කඩකිරීම් හා බැඳුණු රටාවන් පිළිබඳ උද්දේශන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමටත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි අවධානය යොමුකළා වූ විශේෂිත විශ්ලේෂණ හා සාක්ෂිමය විශේෂඥභාවය** අඛණ්ඩව සම්පාදනය කිරීමටත් OSLap ක්‍රියාකරනු ඇත. වගවීම පිළිබඳ ජාත්‍යන්තර මාවත් සමග විශ්වාසය සුරකිමින්, අනුපූරකත්වය පවත්වාගෙන යන අතරවාරයේ, වින්දිතයන්ගේ සහභාගීත්වයට සහ ආරක්ෂණයට අඛණ්ඩව සහායවීමට OSLap කටයුතු කරයි.

ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුරූප වූ **වගවීම පිළිබඳ විශ්වසනීය දේශීය යාන්ත්‍රණයන්** ස්ථාපිත කිරීම සඳහා OHCHR විසින් ශ්‍රී ලංකා රජය සමග සිදුකරන කටයුතුවලට OSLap දායකත්වය සපයනු ඇත.

වයස සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි අවධානය යොමුකළා වූ විශ්ලේෂණ මගින්ද, සත්‍යය, වගවීම සහ වින්දිත පවුල්වල අයිතීන් පෙරට ගැනීම අරමුණු කළ තාක්ෂණික යෙදවුම් සම්පාදනය මගින්ද, OHCHR විසින් **චෙම්මනි සමූහ මිනීවළ** සම්බන්ධයෙන් සිදුකරන කටයුතුවලට OSLap සහාය දක්වනු ඇත.

වගවීම පිළිබඳ විෂය පථයේදී, **බලහත්කාරී අතුරුදහන්කිරීම් පිළිබඳ රටාවන්** හඳුනාගැනීමටත්, සම්බන්ධක සාක්ෂි ශක්තිමත් කිරීමටත්, විධාන වගකීම් අනුව වගවීමේ මාර්ග තක්සේරු කිරීමේ දැක්ම මත, අපරාධ සම්බන්ධයෙන් වගකීමේ විභවය සහිත පුද්ගලයන් පිළිබඳ විශ්ලේෂණාත්මක ලඝු සටහන් සංවර්ධනය කිරීමටත් OSLap ආධාර කරනු ඇත. මීට සමාන්තරව, දැනට ප්‍රසිද්ධියේ පවතින සොයාගැනීම්, පූර්ව අධිකරණමය ක්‍රියාපටිපාටීන් සහ වෝහාරික සාක්ෂි ඇසුරෙන් දැනුවත් වූ ස්වාධීන, පාරදෘෂ්‍ය සහ විශ්වසනීය විමර්ශනයන්ට සහාය වීම සඳහා, වූදිත අපරාධ පිළිබඳ නෛතික අනුලක්ෂණකරණය හා වගකීම් නිශ්චය කිරීම ඇතුළු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුරූප වන **අවම විමර්ශන මානප්‍රමිතීන්** හඳුනාගැනීමට OSLap කටයුතු කරනු ඇත.

දැනට තිබෙන තොරතුරු ශක්තිමත් කිරීමත්, ක්‍රියා පටිපාටිමය වර්ධනයන් නිරීක්ෂණය කිරීමත්, වයස සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි අවධානය යොමුකළ විශ්ලේෂණාත්මක සොයාගැනීම් සහ වගවීමට අදාළව භාවිතා කළ හැකි මාර්ග හඳුනාගැනීමත් මගින් **ලාංඡනික සිදුවීම්** හා සම්බන්ධ වින්දිතයන් සහ ඔවුන්ගේ නියෝජිතයන්ට අඛණ්ඩව ආධාර කිරීමට OSLap ක්‍රියා කරනු ඇත. වෙනත් දෑට අමතරව, බරපතලභාවය, නියෝජකත්වය, සාක්ෂිමය සාධ්‍යතාව සහ වගවීමේ මාර්ගයන්ට ඇති අදාළත්වය ඇතුළු **පාරදෘෂ්‍ය නිර්ණායකයන්ගේ** පදනම මත සිදුවීම් තෝරාගැනීම සිදුකරනු ඇත. අයිතීන් උල්ලංඝනයන්ට සහ දණ්ඩ මුක්තියට අදාළ පුළුල් රටා චිත්‍රණය කර පෙන්වීමට මෙම යොමුවීම දායක වනු ඇත. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව දේශීය මට්ටමින් විශ්වසනීය ප්‍රගතියක් ඉලක්ක කර OHCHR සිදුකරන සංවාදය සහ උද්දේශනයන්ට ද OSLap විශ්ලේෂණ ආධාර කරනු ඇත.

ආධාර කළ හැක්කේ කෙසේද?

තිරසාර සාමය සහ ජාතික සමගිය සඳහා පදනම් වන සත්‍යය, වගවීම සහ ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙනයාමට ඓතිහාසික අවස්ථාවක් **ශ්‍රී ලංකාවට** ඇති බවද, ලාංඡනික සිදුවීම් සහ නීතියේ අධිපත්‍යය කෙරෙහි වන කැපවීම, බරපතල අපරාධ හා සම්බන්ධ වගවීම ඇතුළු විශ්වාසනීය වූත්, නිශ්චිත කාල රාමු සහිත වූත් ක්‍රියාමාර්ගවලට පරිවර්තනය කළ යුතු බවද මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කළ ස්වකීය වාර්තාව මගින් මහ කොමසාරිස්වරයා අවධාරණය කළේය.

51/1 යෝජනාව සහ තදනන්තර යෝජනා යටතේ ලබා දී ඇති වරම ශ්‍රී ලංකා රජය විසින් අබණ්ඩව ප්‍රතික්ෂේප කිරීම පිළිගන්නා OHCHR, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල විශ්වසනීය වගවීමේ ප්‍රයත්නයන්ට ආධාර විය හැකි ප්‍රායෝගික සහයෝගිතාව අබණ්ඩව අපේක්ෂා කරයි.

OHCHR වෙත ලබා දී ඇති වරමට ආධාර කිරීමේ අත්‍යවශ්‍ය භූමිකාවක් ඉටුකිරීමට **එක්සත් ජාතීන්ගේ අවශේෂ සාමාජික රටවලටද** පුළුවන. ශ්‍රී ලංකා රජය අර්ථකාරී ගණුදෙනු කිරීම සඳහා දිරිගැන්වීමටත්, වගවීමට උපකාරී වන පරිසරයක් පෝෂණය කිරීමටත් ඔවුන්ට හැකියාව තිබේ. අදාළ තොරතුරු සහ සාක්ෂි බෙදාගැනීමත්, සහායවීම සඳහා ඉල්ලීම ඉදිරිපත් කිරීමත්, දැනට පවතින දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර යාන්ත්‍රණයන් හරහා වගවීම හඹායාමත් මගින් OSLapහි වැඩ කටයුතුවල බලපෑම ශක්තිමත් කිරීමට ද සාමාජික රාජ්‍යයන්ට හැකි ය.

යෝග්‍ය වීසා සහ රැකවරණ ක්‍රියාමාර්ගයන්ද, වින්දිතයන් සහ බෙදීගත්තවුන්ට මනෝ සාමාජීය, වෛද්‍ය සහ නීතිමය ආධාරවලට සහායද, සිවිල් සමාජ සංවිධාන හරහා ලේඛනගත කිරීම් හා විමර්ශන ධාරිතාව ශක්තිමත් කිරීමද ඇතුළු වින්දිතයන් සහ සාක්ෂිකරුවන් කරා සුරක්ෂිතව ප්‍රවේශ වීමට පහසුකම් සැපයීම මගින්ද මීට තවදුරටත් දායක වීමට සාමාජික රාජ්‍යයන්ට හැකියාව තිබේ.

විශේෂයෙන්ම, ස්ථාපිත ප්‍රොටෝකෝලයන් සහ ඉහළම පිළිවෙත්වලට අනුකූලව අදාළ තොරතුරු ආරක්ෂා සහිතව බෙදාගැනීම හරහා OSLap වැඩ කටයුතු සඳහා සහාය දක්වන මුඛ්‍ය හවුල්කරුවන් වන්නේ **සිවිල් සමාජ සංවිධානයන්** ය. කාලෝචිත ඇගයීම් පහසු කරවමින් සහ සංවේදී තොරතුරුවල නිසි පරිහරණය හා ආරක්ෂාව සහතික කරමින්, OHCHR සතු සුරක්ෂිත ඩිජිටල් මෙවලම් භාවිතා කොට වාර්තා, සාක්ෂි ප්‍රකාශ සහ වෙනත් දෑ සංක්ෂිප්ත සාරාංශයන් සමග සම්පාදනය කිරීමට සිවිල් සමාජ සංවිධාන දිරිමත් කෙරේ. සම ජාලයන්ද, මනෝ-සමාජීය සහායද, යුක්ති යාන්ත්‍රණයන්ට ප්‍රවේශවීමට මඟ පෙන්වීමද ඇතුළු ක්‍රියාමාර්ග මගින් වින්දිතයන්ට සහ බෙරීගත්තවුන්ට ආධාර සැපයීමේ කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කිරීමට සිවිල් සමාජ සංවිධානවලට හැකි ය. වගවීම තහවුරු කිරීමේ ප්‍රයත්නයන් දැනුවත් කිරීම සඳහා නන්විධ පර්යාවලෝකයන්ගේ දායකත්වය සහතික කිරීමට උපකාර වෙමින්, හානියට පත් ප්‍රජාවන් අතරත්, නීති විශාරදයන් සහ OSLap අතරත් සම්බන්ධතාවලට පහසුකාරකත්වය සැපයීමට ඔවුන්ට පුළුවන. OSLap සමග සිදුකරන නිරන්තර සන්නිවේදනයන් මගින්, වින්දිත කේන්ද්‍රීය හා සහානුභූතික ප්‍රවේශයක් ප්‍රතිබල ගන්වන ප්‍රතිචාරයන් සහ ආලෝචනාවන් සම්පාදනය කිරීමට වින්දිත කණ්ඩායම්වලට සහ අවශේෂ සිවිල් සමාජ සංවිධානවලට හැකියාව ලැබේ.

ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ ජාත්‍යන්තර අවධානය පවත්වාගෙන යාමට සිවිල් සමාජ සංවිධානවල උද්දේශන ක්‍රියාමාර්ග සහ දැනුවත් කිරීමේ ප්‍රයත්නයන් ඒ හා සමානවම අත්‍යවශ්‍ය වේ. ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණයන් සමග කටයුතු කිරීම මගින්, OHCHR වෙත ලැබී ඇති වරමට ලබාදෙන සහයෝගය තිරසාර කිරීමටත්, වින්දිතයන් සඳහා වූ යුක්තිය සහ ප්‍රතිකර්ම පෙරට ගැනීමටත් දායකවීමට ඔවුනට පුළුවන.